# පුංචි මගේ කවි




දිමන්සා තෙනුසරි එදිරිසිංහ

# පුංචි මගේ කවි


## දිමන්සා තෙනුසරි එදිරිසිංහ

කතෘ



පළමු දිගහැරුම

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය C

චිත්‍ර නිර්මාණය : දිමන්සා තෙනුසරි එදිරිසිංහ

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN අංකය : 978-624-208-953-9

# පිදුම

"අ" යනු "ආ" යනු මුලින්ම කියා දුන්
මගේ ආච්චීටත්,
මහාමායා මව් තුරුළට ආ දිනේ පටන්
මට ගුරුහරුකම් දෙන,
මෙම ග්‍රන්ථය රචනා කිරීමට මා දිරිගැන්වූ
තමිලා කරුණාරත්න ගුරුමෑණියන්ට හා
මහාමායා විදු මෑණියන්ටත්,
සෙවනැල්ලක් සේ නිරතුරුව මා අසලින් රැඳෙමින්
මට ශක්තියක් වන
මගේ ආදර අම්මාට හා අප්පච්චීටත්,
පොත් වලට ආදරය කරන
මගේ පුංචි යාළුවන්ටත්
ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන **"හේමාමාලා උපහාර ගත් කරණ"** ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යෙමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින්, ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය, කන්ද උඩරටට අගයක් එකතු කළ , ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි . මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු .

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශිලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත

සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශිලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල

දියවඩන නිලමේ

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

# පටුන


| | |
|---|---|
| මගේ අම්මා | 1 |
| අපේ ගුරුතුමී | 2 |
| හාවා | 3 |
| උදෑසන | 4 |
| රෑ අහස | 5 |
| වැස්ස | 6 |
| සමනලයා | 7 |
| කිටී | 8 |
| සරුංගලය | 9 |
| සිංහල අවුරුදු | 10 |
| දේදුන්න | 11 |
| මාළුවා | 12 |

# මගේ අම්මා

මගේ හොඳ අම්මා
මට කිරි දුන්නා
රස කවි කියලා
මාව නැළෙව්වා

මගේ හොඳ අම්මා
මට ගොඩක් ආදරෙයි
මගේ අම්මට මම
ගොඩක් ආදරෙයි



# අපේ ගුරුතුමී

අපේ ගුරුතුමී
අකුරු කියා දෙයි
අපිට ආදරෙයි
අපිත් ආදරෙයි



# හාවා

ලස්සන පොඩි හාවා
අපේ වත්තට ආවා
උඳුපියලිය කෑවා
යන්න ගියා හාවා



# උදෑසන

උදෑසනම ඉර පායා
එළිය වැටෙනවා
පුංචි ළමයි උදෑසනම
පාසල් යනවා
කුරුළු රංචු එකතු වෙලා
කෑම සොයනවා
පුංචි පුංචි සමනලයින්
මල් පැණි බොනවා



# රෑ අහස

හඳ හාමි පායලා
අපේ දිහා බලනවා
තරු පැංචෝ පායලා
දිලිසි දිලිසි බබළනවා





# වැස්ස

වැස්ස වහිනවා
ගස් ඇඹරෙනවා
ලේන් පැටියා
ගෙදර කැඩිලා
අම්මා සොයනවා

# සමනලයා

සමනලයෝ සමනලයෝ
මෙහාට එන්න
අපේ ගෙදර මල් වත්තේ
මල් පැණි බොන්න



# කිටී

අපේ ගෙදර කිටී
දුඹුරු පාට කිටී
හරි ලස්සන කිටී
මගෙ සුරතල් කිටී



# සරුංගලය

පාට පාට සරුංගලේ
අප්පච්චි හදපු සරුංගලේ
රතු පාටයි නිල් පාටයි
කහ පාටයි කොළ පාටයි
අයියයි මමයි එකතුවෙලා
උඩ යවනවා සරුංගලේ



# සිංහල අවුරුදු



කොහෝ කොහෝ
කොහෝ හාමි කෑ ගහනවා
එරබදු මල් පිපෙනවා
කජු පුහුලන් හැදෙනවා
පුංචි ළමයි ඔංචිල්ලා පදිනවා
කැවුම් කොකිස් හදනවා
අපි සතුටින් ඉන්නවා

# දේදුන්න



දේදුන්නේ දේදුන්නේ
ඔය ලස්සන පාට පාට
කොහෙන්ද ඔයාට හම්බවුණේ
දේදුන්නේ දේදුන්නේ
ඔයා හරිම ලස්සනයි
අව්වයි වැස්සයි අතරින්
ඔයා එද්දි මට හරි ආසයි

# මාළුවා

අපේ ගෙදර ටැංකියේ
ලස්සන පොඩි මාළුවා
පාට පාට වරල් ගසා
පීන පීන ඉන්නවා



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යෙමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රිය හික්මීම මෙන්ම සාරධර්මනිපුණතා ප්‍රවර්ධනයත්, යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට, ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය , ගුරුභවතුන් , දෙමාපියන් , ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියළු දෙනාටද , දියවඩන නිළමතුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්යය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ )

ISBN 978-624-208-953-9